# GLOBAL ACADEMIC RESEARCH INSTITUTE

COLOMBO, SRI LANKA

## GARI International Journal of Multidisciplinary Research

ISSN 2659-2193

**Volume: 08 | Issue: 01**

On 31st December 2021

http://www.research.lk



Author: U.G. Nadeesha Dilrukshi Weerasinghe

University of Visual & Performing Arts, Sri Lanka



GARI Publisher | Fashion Design | Volume: 08 | Issue: 01

Article ID: IN/GARI/ICMDVPA/2021/104 | Pages: 74-82 (09)

ISSN 2659-2193 | Edit: GARI Editorial Team

Received: 05.07.2021 | Publish: 31.03.2022

# රජගල ඓතිහාසික පුරාවිද්‍යා භූමියෙන් හමු වූ පබළු සඳහා යොදාගෙන ඇති මෝස්තර මූලිකාංග හා මූලධර්ම

**යූ. ජී. නදීෂා දිල්රුක්ෂි වීරසිංහ** (nadeeshadw7@gmail.com)
කථිකාචාර්ය (ආධුනික), සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

***සාරාංශය***

*පුරාතනයේ සිටම ආභරණ නිර්මාණය ශිල්පය ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධව පැවැති සංස්කෘතික උරුමයක් ලෙස දැකගත හැකි අතර පරම්පරා ගණනාවකට පෙර ආභරණ නිර්මාණය කර ඇති ආකාරය හා සසඳන කල, නූතනත්වයට අනුබල දෙන පැරණි සම්ප්‍රදායයන් හා මෝස්තර දැකගත හැකිය. එවැනි සම්ප්‍රදායයක් පිළිබඳ සාක්ෂ්‍ය රැසක් පවතින තවමත් විශ්ලේෂණයට භාජනය නොකළ පබළු රැසක් රජගල ඓතිහාසික පුරාවිද්‍යා භූමියෙන් හමුවී ඇත. අනුරාධපුර යුගයට අයත් බවට සැලකෙන සංස්කෘතික උරුමයක් වන මෙම දේශීය පබළු පිළිබඳ සැලසුම්කරණමය දත්ත විශ්ලේෂණයක් සිදු කිරීම, පබළු නිර්මාණ ශිල්පියා විසින් භාවිත සැලසුම්කරණමය සාධක, ශිල්ප ක්‍රම සහ උපක්‍රම අධ්‍යනය කිරීම, වර්තමාන සැලසුම්කරණ ක්ෂේත්‍රය සඳහා අදාළ කර ගත හැකි දේශීය අනන්‍යතාවයකින් යුතු නව සංකල්ප සහ ක්‍රමවේදයන් හඳුනා ගැනීම මෙම අධ්‍යනයෙහි අරමුණු විය.*

*රජගල පුරාවිද්‍යා කැනීම් ක්ෂේත්‍රය ක්ෂේත්‍ර අධ්‍යනයක් ඔස්සේ තොරතුරු රැස් කරන ලදී. සැළසුම්කරණ මූලිකාංග හා මූලධර්ම පිළිබඳව විමර්ශනයේදී ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි විශ්ලේෂණය සිදු විය. එනම්, පබළු භාවිතය සහ උපයෝගීතාවය, නිර්මාණ ක්‍රමවේදය හා තාක්ෂණය, අමුද්‍රව්‍ය භාවිතය සහ කලා ශිල්ප යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි උක්ත විශ්ලේෂණය සිදු විය.*

*රජගල පුරාවිද්‍යා භූමියේ පබළු මූලික කොටගත් ඍජු සැලසුම්කරණමය ගවේෂණයක් දැකිය නොහැකිය. එබැවින් මෙම පර්යේෂණය අනුරාධපුර යුගයටත් පෙර සමයේ යටව ගිය හෙළ නිර්මාණකරුවාගේ විශිෂ්ඨ නිර්මාණ කුලකයක පුනරාවලෝකනයකි. එසේම දේශීය අනන්‍යතාවයකින් යුතු නව සංකල්ප, ක්‍රමවේදයන් සහ ශිල්පක්‍රම මෙම පර්යේෂණයෙන් හඳුනාගත හැකි විය. රජගල පුරා විද්‍යා ක්ෂේත්‍රයේ ද්‍රව්‍යාත්මක ශේෂයන් ලෙස හමුවන පබළු වල නිර්මිත හැඩ පිළිබඳ විශ්ලේෂණයේදී ඒවා සාමාන්‍ය පරිසරයේ පවතින ඵල හා ජ්‍යාමිතික හැඩ ආදියට සමාන බවක් දක්වන බව තාර්කිකව නිගමනය කළ හැක. කානීලියන්, අගස්ති, අඹතෙස්ත, තිරුවානා, පැහැදිලි තිරුවානා, රෝසතිරුවානා, දුම්තිරුවානා බෙරිල් ආදී දේශිය හෝ විදේශිය සම්බන්ධතාවයක් ඇති ඛනිජ හා පාෂාණ ද වීදුරු ටෙරාකොටා වැනි දෑ ද මේ සඳහා අමුද්‍රව්‍ය වී ඇති බව පෙනේ. රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ හමු වූ පබළු සමකාලීන අනුරාධපුර යුගයේ පබළු වල හැඩ, වර්ණයන්ට සමාන බව නිගමනය කළ හැකිය. මේවා නිර්මාණය සඳහා යොදා ගැනීමේදී ඒ සඳහා සුවිශේෂ තාක්ෂණික පියවර නිරූපණය කරන නිදර්ශන මෙතුළින් හඳුනාගත හැකි විය.*

***මුඛ්‍ය පද-*** *පබළු, සැළසුම්කරණය, මෝස්තර මූලිකාංග, මෝස්තර මූලධර්ම, සංස්කෘතික උරුමය*

## හැඳින්වීම

අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ව පිහිටි රජගලතැන්න හෙවත් රාස්සපොළ විශාලත්වයෙන් දෙවැනි වනුයේ අනුරාධපුර රාජධානියට පමණි. මෙම ඓතිහාසික භූමිය ආශ්‍රිතව ක්‍රි.පූ. 1-2 සියවස්වලට අයත් සෙල්ලිපි 54 ක් හා පුරාවිද්‍යා ස්මාරක 380ක් පමණ සොයාගෙන ඇත. ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික උරුමයන් රැඳි රජගලතැන්න දීපවංශය, මහාවංශය, සමන්ත පාසාදිකාව ආදි ග්‍රන්ථවල අරියාකාර, තිස්ස පබ්බත, රජගල, රාස්සපොළ යනාදී ලෙස හඳුන්වන නම් ගණනාවකි. දුටුගැමුණු රජුගේ සහෝදරයා වු සද්ධාතිස්ස කුමාරයාගේ වැඩිමහල් පුත් ලජ්ජිතිස්ස කුමාරයා විසින් අරණ්‍ය සේනාසයක් ලෙස මෙම භූමිය සංඝයාට පුජා කළ බව මහාවංශයේ 33 වෙනි පරිච්ඡේදයේ සඳහන් වේ.

රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතිමය භූමිය තුළ ගවේෂණ, කැණීම්, සංරක්ෂණ යනාදී ත්‍රිත්ව මුලධර්ම හරහා පුරාවිද්‍යානුකූල මැදිහත් වීම සිදු වෙමින් පවතින අතර ඉදිරියෙහි දී තවත් අගනා පුරා වස්තූන් හඳුනා ගැනීමට හැකිවන බවට අපේක්ෂා කළ හැකිය.

දැනට සොයාගෙන ඇති පුරාවස්තු අතර පැරණි කාසි බවට හඳුනාගත හැකි අවශේෂ මැටි වලින් තැනූ උපකරණ සහ නිර්මාණ, ලෝහ වලින් තැනූ මුදු, ඛනිජ හා පාෂාණ වලින් තැනූ පබළු ආදීයෙන් මෙම පුරාවස්තු එකතුව සමන්විත වේ. මෙහි දී රජගල පුරාවිද්‍යා භූමිය

ආශ්‍රිත පබළු කෙරෙහි පමණක් අවධානය යොමු වන අතර මෙය නිර්මාණ ශිල්පීය ගවේෂණයක් මිස රසායනාගාර පර්යේෂණ හෝ විද්‍යාත්මක අධ්‍යයනයක් නොවේ.

අනුරාධපුර යුගයට අයත් බවට සැලකෙන සංස්කෘතික උරුමයක් වන මෙම දේශිය පබළු පිළිබඳ සැලසුම්කරණමය දත්ත විශ්ලේෂණයක් සිදු කිරීම, පබළු නිර්මාණ ශිල්පියා විසින් භාවිත සැලසුම්කරණමය සාධක, ශිල්ප ක්‍රම සහ උපක්‍රම අධ්‍යනය කිරීම, වර්තමාන සැලසුම්කරණ ක්ෂේත්‍රය සඳහා අදාළ කර ගත හැකි දේශීය අනන්‍යතාවයකින් යුතු නව සංකල්ප සහ ක්‍රමවේදයන් හඳුනා ගැනීම මෙම අධ්‍යනයෙහි අරමුණු විය.

**ක්‍රමවේදය**

දත්ත හා තොරතුරු රැස් කිරීමේදී රජගල පුරාවිද්‍යා කැනීම් ක්ෂේත්‍රයේ ක්ෂේත්‍ර අධ්‍යනයක් ඔස්සේ මෙන්ම අල්ප වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර ද භාවිත කරමින් දත්ත හා තොරතුරු රැස් කරන ලදී. එම දත්ත විශ්ලේෂණයේදී සම්මත සැළසුම්කරණ මූලිකාංග හා මූලධර්ම උපයෝගී කොට ගැණිනි. මෙම විමර්ශනයේදී පබළු භාවිතය සහ උපයෝගීතාවය, නිර්මාණ ක්‍රමවේදය හා තාක්ෂණය, අමුද්‍රව්‍ය භාවිතය සහ කලා ශිල්ප යන ක්ෂේත්‍ර කිහිපයක් ආවරණය වන පරිදි විශ්ලේෂණය සිදු විය. එහිදී අවශ්‍ය පරිදි අතට ගෙන පරීක්ෂා කරමින්, විවිධ මතුපිට මත තබමින් නිරීක්ෂණ සහ සම්පරීක්ෂණ ඇසුරෙන් උක්ත විශ්ලේෂණය සිදු විය.

**සාහිත්‍ය සමාලෝචනය**

අධ්‍යයනයට සම්බන්ධ තේමාවට අදාළව පවත්නා ශාස්ත්‍රීය ඥානය විචාරාත්මකව ඇගයීමේදී මේ පිළිබඳ නිශ්චිතව සඳහන් ග්‍රන්ථ අල්පය. මේ පිළිබඳ හමුවන නාලනී මල්කාන්ති විසින් රචිත පබළු නිර්මාණ, ජේතවනාරාම පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 03 (2008) ග්‍රන්ථයෙන් සමකාලීන පබළු නිර්මාණයන්හී භාවිතය සහ උපයෝගීතාවය, නිර්මාණ ක්‍රමවේදය හා තාක්ෂණය, අමුද්‍රව්‍ය භාවිතය සහ කලා ශිල්ප යන ක්ෂේත්‍ර සඳහා තොරතුරු හමුවේ. සාහිත්‍ය විමර්ශනයෙන් ලද දත්ත අනුව සමකාලීනව වඩාත් දියුණු තාක්ෂණික උපක්‍රම භාවිත කර ඇති බව විමර්ශනයට භාජනය වූ ලිපි හා කෘති මඟින් තහවුරු වේ. එමෙන්ම මෙම තේමාවට අදාළව සෘජු පර්යේෂණයක් මෙතෙක් ප්‍රකාශයට පත් ව නොමැත.

**දත්ත විශ්ලේෂණය**

රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් හමු වූ පබළු බහුතරයක් බෝධිඝරය තුළින් අනාවරණය වූ ඒවාය. බහුතරය නිරුපද්‍රිතය. මේ සඳහා සුවිශේෂි තාක්‍ෂණ ක්‍රම යොදාගත් බව පබළුවල මතුපිට පෘෂ්ඨය පිරික්සීමේ දී පෙනේ. මෙහිදි මෙතෙක් පැහැදිලිව හඳුනා නොගත් තවත් ඛනිජ හා පාෂාණ රැසකින් නිර්මිත පබළු මේ අතර වේ. කානීලියන්, අගස්ති, අඹතෙස්ත, තිරුවානා පැහැදිලි තිරුවානා, රෝසතිරුවානා, දුම්තිරුවානා බෙරිල් ආදී දේශිය හෝ විදේශිය සම්බන්ධතාවයක් ඇති ඛනිජ හා පාෂාණ ද වීදුරු ටෙරාකොටා වැනි දෑ ද මේ සඳහා අමුද්‍රව්‍ය වී ඇති බව පෙනේ.

**මෝස්තර මූලධර්ම හා මූලිකාංග**

රජගල පුරා විද්‍යා භූමියෙන් හමු වූ පබළු පිළිබඳ සලකා බැලීමේදී ඒවායෙහි මෝස්තර මූලධර්ම සහ මූලිකාංග හඳුනා ගැනීම මෙම පර්යේෂණයෙහි මූලික අපේක්ෂාව වේ. පබළු හෝ යම් කිසි නිර්මාණයක් නිමා වී ඇත්තේ රේඛා(Line), හැඩතල(Shape), වර්ණ(Color), ආකෘතිය(Form), වයනය(Texture), අවකාශය(Space) ආදී වූ මෝස්තර මූලිකාංගයන්ගෙන් හා තුලනය(Balance), සමානුපාතය(Proportion), රටාව,(Pattern) රිද්මය(Rhythm), විවිධත්වය(Variety), සුසංයෝගය(Harmony), ඒකත්වය(Unity) ආදී වූ මෝස්තර මූලධර්මයන්ගේ එකතුවෙනි.

**රේඛාව (Line)**

රේඛාව යනු යම් කිසි නිර්මාණයක ප්‍රධානතම මූලිකාංගයයි. පළලට වඩා දිගින් යුතු ලකුණක් හෝ සටහනක් රේඛාවක් ලෙස හඳුන්වාදිය හැකිය. ඒ අතර සිරස් තිරස් විකර්ණ අක් වක් තරංගාකාර ආදී වූ විවිධ රේඛා වර්ගයන් වේ.

රජගල පුරා විද්‍යා ක්ෂේත්‍රයෙන් සොයා ගැණුනු රූපය- 02.2 දරණ ඡායාරූපයෙහි දක්වෙන පබළු එකකට එකක් සමාන නොවේ. විවිධ පෂාණයන්ගෙන් නිර්මිත මෙම පබළු අතර එන තිරුවානා හෝ පළිගු වලින් නිර්මිත අරළු ගෙඩියේ හැඩැති පබළුව සලකා බැලූ විට එහි රේඛාමය විහිදීම පබළුව ට අලංකාරයක් එක් කරයි. මෙහි එක් පසෙක ඇති සිදුර ආසන්නයෙන් ඇරඹි රේඛා අනෙක් පස

සිදුර තෙක් විහිද යයි. යම් පෘෂ්ඨයක් මත තබා ඉහළ සිට බලන්නෙකුට සරල රේඛා කිහිපයක් හඳුනාගත හැකි අතර එහි ඇඳුනු වක්‍රාකාර රේඛා කිහිපයක්ද හඳුනාගත හැකිය. එහි හරස්කඩක් ගෙන බැලූවිට මලක පෙති ආකාරයෙන් විහිද ගිය අක් වක් රේඛාද හඳුනා ගත හැකි වේ. (රූපය- 10)

අන් පබළු වලට වඩා විශේෂිත වූ රූපය- 02.4 හි දැක්වෙන කොලර් පබළුවද බෝධිඝරය ආශ්‍රයෙන් සොයාගන්නා ලද්දකි. මෙහි ඇති රේඛාමය පැතිකඩ දෙස විමසිලිමත්ව බැලූ කල රේඛා වර්ග කිහිපයක් හඳුනා ගත හැකිය. එහි ඉහළින් සිඳී ගිය කොටසක සලකුණු පෙන්වන අතර නියමිත හැඩය මෙය නොවන බවටද හඳුනාගත හැකිය. එහි තවත් කොටසක් සමග නිර්මාණය වූ බවට එය සලකුණක් විය හැකිය. කෙසේ වෙතත් විවිධාකාර වූ වක්‍ර රේඛා සමූහයක් සහ රළාකාර රේඛාද එහි බාහිරින් හඳුනාගත හැකි වේ. (රූපය- 11)

තවත් විශේෂිත වූ හැඩයකින් නිරූපණය වන රූපය- 09 ඡායාරූපයෙන් දැක්වෙන විශේෂ පබළුව තුළින් විරලව හඳුනාගත හැකි රේඛා වර්ගයක් වූ සරල රේඛා වේ. ඒවා සිරස් තිරස් හා විකර්ණාකාර වේ. (රූපය- 12)

අගස්ති හෝ ඊට සමාන අමුද්‍රව්‍යයකින් නිර්මිත රූපය- 07.4 ඡායාරූපයෙහි දැක්වෙන පබළුවෙහි දෙමුහුනත් එකිනෙකට අසමාන වේ. කේතුක හැඩයක් ගන්නා මෙහි විස්තර කළ හැකි රේඛා වර්ග සමූහයකි. එහි හඳුනාගත හැකි වක්‍ර රේඛා ප්‍රමාණයෙන් එකිනෙකට වෙනස් බවක් ගනී. එසේම එකිනෙක ගමන් කරන්නේ සමාන්තරවය. මෙහි එන අනෙක් පබළු තුළද සුවිශේෂී වූ රේඛා ශෛලියක් හඳුනාගත හැකිය. (රූපය- 13)

**හැඩය ( Shape)**

රේඛාවක් සම්පූර්ණව මුල අග එකට එකතු වීමෙන් හැඩයක් නිර්මාණය වේ. මෙහි ආකෘතිය ද්විමානය. හැඩයක උසින් හා පළලක් ඇති නමුත් එහි ගැඹුරක් නොදක්වයි. හැඩයන් මූලික කොටස් 2 කි. එනම් ව්‍යුක්ත/ශෛලීගත හැඩ හා ජ්‍යාමිතික හැඩ වේ.

ජ්‍යාමිතික හැඩයන් තුළින් සමචතුරස්‍ර, සෘජුකෝණාස්‍ර, වෘත්ත, ඉලිප්සාකාර, ත්‍රිකෝණ, රොම්බසය, ත්‍රිපීසාකාර, සමාන්තරාස්‍ර, පංචාස්‍ර, ෂඩාස්‍රය, අෂ්ටාස්‍රය, දශාස්‍රය ආදී මූලික හැඩ තිබුණ ද එයට එහා ගිය තරු හැඩ ආදිය ද ඇත. ව්‍යුක්ත හෝ ශෛලීගත හැඩ යනුවෙන් අදහස් වෙන්නේ සමමිතික නොවන විවිධ හැඩතලය. ඒවා බොහෝ විට පරිසරයේ ඇති මල්, ගස්, එල, කොල, දියබිඳු වැනි හැඩතල විය හැකිය.

රජගල පුරාවිද්‍යා භූමියේ හමු වූ පබළු වල බොහොමයක් ඇත්තේ වෘත්තාකාර, ඉලිප්සාකාර, ෂඩාස්‍රකාර, ත්‍රිපීසාකාර වැනි පබළුය. ඒ අතුරින් සුවිශේෂී වූ නෙල්ලි ගෙඩියේ හැඩැති පබළු, අරළු ගෙඩියේ හැඩැති සහ කළසක හැඩැති පබළු සුවිශේෂී වේ.

බෝධිඝරය තුළින් හමු වූ රූපය- 08 දරණ පළිඟු පබළුවෙහි වෘත්තාකාර හැඩයක් දැකගත හැකිය. (රූපය- 17) 8-B ස්ථූප මළුවෙන් සොයාගත් පබළු දෙකෙහි විශාල පබළුවේ හැඩය ඉලිප්සයකි. රූපය- 03 දරණ කුඩා පබළුවෙහි හැඩය කලසකට සමානය. (රූපය- 21) මෙහි ප්‍රමාණය 7mm වේ. රූපය- 06 ලෙස දැක්වෙන මැටි පබළු වල හැඩය වෘත්තාකාර හැඩ දෙකක එකතුවෙන් නිර්මාණය වූවකි. එහි පැති පෙනුම ඉලිප්සාකාර වේ. 5mm තරම් කුඩා වූ එහි මධ්‍යයෙහි ඇති වෘත්කාකාර හැඩය සින් සිදුරක් වන අතර එයින් නූල් දමා එකිනෙකට පබළු අමුණා ආභරණ ලෙස පළඳින්නට ඇතැයි අනුමාන කළ හැකිය. (රූපය- 23)

රූපය- 04 දරණ බෝධිඝරයෙන් සොයාගත් ගල් පබළුවෙහි පැති පෙනුම ෂඩාශ්‍රාකාරය. එහි ඉහළින් බැලූ විට හැඩය චතුරශ්‍රයක් හා වෘත්තයකි. (රූපය- 20)

බෝධිඝරය තුළින් සොයාගත රූපය- 07 දරණ විශේෂ පබළු 4න් එක් පබළුවක් ඒකාකාර හැඩයක් නොගනී. වර්ණ 3කින් යුක්තව දැකිය හැකි පබළුව ෂඩාස්‍රාකාර වේ. එහිම තවත් පබළුවක් වෘත්තාකාර වන අතර සෙසු පබළුව ත්‍රපීසාකාර වේ. (රූපය- 22) බෝධිඝරය තුළින් හමු වූ රූපය- 05 දරණ විශේෂ පබළු දෙක එකම හැඩයෙන් සහ ප්‍රමාණයෙන් යුත් පබළු දෙකකි. මූලික හැඩය පංචාශ්‍රයකි.මධ්‍යයෙහි වෘත්ත හැඩයකි. මෙහි එන පළිඟු පබළුව කොහොඹ ගෙඩියක හැඩය ගනී.

විශේෂ පබළු (විවිධ වර්ග) ලෙස හඳුන්වා ඇති පබළු 23න් රූප- 01-02 වෘත්තාකාර ඉලිප්සාකාර හැඩ මෙන්ම කලසක හැඩය මී ඇටයක හැඩය නෙල්ලි ගෙඩියක හැඩය විශේෂයෙන් හඳුනාගත හැකිය. (රූපය- 19)

**වර්ණ භාවිතය**

ආලෝකය පරාවර්තනය තුළින් අපගේ ඇසට පෙනෙන දෙයක් ලෙස වර්ණ හඳුන්වා දිය හැකිය. එසේම එය ආලෝකයෙහි එක් ලක්ෂණයක්ද වේ. රජගල පබළු වල වර්ණ සලකා බැලූ විට සෑම පබළුවක්ම පාහේ එය නිර්මිත අමුද්‍රව්‍යයෙහි වර්ණය එලෙසම තබා ඇති බව පෙනේ. මෙම පබළු පිටතින් සායම් කිරීම හෝ සායම් මගින් මෝස්තර ඇඳීම වැනි ක්‍රියාවන් මගින් විචිත්‍රවත් කොට නොමැති බව පෙනේ.

තැඹිලි පැහැයෙන් යුක්ත රූපය- 09 ඡායාරූපයෙහි දක්වෙන පබළු යුගලය කානීලියන් බවට නිගමනය කළ හැකිය. ඉතාමත් දීප්තිමත් වර්ණයක් සහිත මාධ්‍යයක් වන මෙය විදේශයකින් ගෙන්වන ලද්දක් විය හැකිය. මීට සමාන පබළු රාශියක් අනුරාධපුර ආශ්‍රයෙන්ද හඳුනාගෙන තිබේ.

ටෙරා කොටා වලින් නිර්මිත රූපය- 06 ඡායාරූපයෙහි පබළු දුඹුරු පැහැයෙන් යුක්ත වේ. මැටි වලින් නිමවා පිලිස්සීමට ලක් කිරීමෙන් මෙම පබළු නිර්මාණය කර තිබේ. මෙය සුලබ වශයෙන් පබළු නිර්මිත මාධ්‍යයක් වන අතර දුඹුරු පැහැය සාමාන්‍ය පැහැය වේ. නමුත් ටෙරා කොටා පබළු ජල වාෂ්ප සහිත අවකාශයට නිරාවරණය වීමෙන් ඒ මත ඇතිවන දිලීර සහ වෙනත් උපද්‍රවයන් නිසා පැහැයෙහි වෙනසක් ඇතිවන අවස්ථා ද දකගත හැකිය. රූපය- 03 ඡායාරූපයෙහි දැක්වෙන පබළුව එවන් අවස්ථාවක් නිරූපණය කරන අතර එහි පැහැය දුඹුරු මිශ්‍ර කොල පැහැයකට හැරී තිබේ.

මෙම පුරා විද්‍යා ක්ෂේත්‍රය තුළදී හමු වූ වීදුරු පබළු රාශියකි. ඒවා විවිධ වර්ණයන්ගෙන් යුක්ත වන අතර රතට හුරු දුඹුරු, කොල, තැඹිලි, කහ වැනි වර්ණ රාශියක් හඳුනාගත හැකිය. එසේම පැහැයක් නොමැති විනිවිද පෙනෙන පැහැදිලි වීදුරු වලින්ද පබළු නිමවා තිබේ.

වීදුරු පබළු වලට වර්ණයන් භාවිත කිරීම සංකීර්ණ කාර්යයක් වු බව පෙනේ. මේ පිළිබඳ තවමත් පර්යේෂණයන් නිමා වී නොමැති අතර එහි වර්ණ කිරීම සිදු වූ ආකාරය ඉන්දීය පුරා විද්‍යාඥයින් විසින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵල අනුව පෙන්වා දිය හැකිය. වර්ණ ගැන්වීම උදෙසා සිලිකා සහ ශාක පිළිස්සූ අළු මිශ්‍ර කර උණු කිරීමෙන් සාදා ගන්නා ලද බදාමයට ලෝහ ඔක්සයිඩ මිශ්‍ර කර නැවත උණු කිරීමෙන් එම වර්ණයන් සාදා ගත් බවට මෙම පබළු එකතුව නිරීක්‍ෂණය කිරීම තුළින් උපකල්පනය කළ හැකිය.

නිල්, කහ, කොළ, කළු ⟶ යකඩ

නිල් පැහැති කොළ, රතු, තැඹිලි ⟶ තඹ, ඊයම්

පැහැදිලි වීදුරු, දම්, කළු ⟶ මැන්ගනීස්

විනිවිද නොපෙනෙන බව ඇති කිරීම ⟶ අඟුන්

මෙවන් වර්ණවත් වීදුරු පබළු රාශියක් ජේතවනය ආශ්‍රිතව ද සොයා ගෙන තිබේ. අගස්ති නම් ඛනිජයෙන් නිර්මාණය කරනට ඇති බවට අනුමාන කළ හැකි පබළු කිහිපයක් වන අතර මේවා තැඹිලි මිශ්‍ර දුඹුරු පැහැයක් ගනී. මෙම සමහර පබළු අතර එකම පබළුවක කළු, අළු සහ දුඹුරු යන වර්ණ කිහිපයක් දක්නට ලැබේ. (රූපය- 07)

### ආකෘතිය (Form)

හැඩයක් ත්‍රිමාණ වූ විට ආකෘතියක් වේ. එනම් හැඩය ද්විමාන වන අතර ආකෘතිය ත්‍රිමාන වේ. එයට උසක් පළලක් හා ගැඹුරක් ඇත. වර්ණයෙහි ස්වභාවය උපයෝගී කර ගනිමින් එළිය අඳුර සහ ඉස්මතුවීම් ඔස්සේ වස්තුවක නියම ආකෘතියක් හඳුනාගත හැකිය. රජගල පුරා විද්‍යා භූමියෙන් හමු වූ පළිඟු පබළුවෙහි ආකෘතිය ගෝලාකාරය. ප්‍රමාණය 8mm පමණ වේ. (රූපය- 08)

ස්ථූප මළුවෙන් හමු වූ 9mm වන පබළුවෙහි ආකෘතිය කොලර් පබළුවක් ලෙස හඳුනාගත හැකිය. (රූපය- 03) බෝධිඝරයෙන් සොයාගත් ගල් පබළුවෙහි ආකෘතිය ද්විත්ව පුනීලාකාර වේ. (රූපය- 04) මේ අතර සමමිතිතික නොවන ව්‍යුක්ත රූපී ආකෘති ගන්නා පබළුද දකගත හැකිය. (රූපය- 07) මීට අමතරව නෙල්ලි ගෙඩිය, මදටිය ඇටය, සිලින්ඩරාකාර, ඔබ්ලේට්, බැරල්, පෙයාර් ආකෘතිය, පුරුක් කරන ලද පබළු. කොලර් පබළු වැනි ආකෘති දකගත හැකිය. (රූපය- 19)

### වයනය/මතුපිට ස්වභාවය(Texture)

නිර්මිත අමුද්‍රව්‍ය අනුව වයනය හෙවත් මතුපිට ස්වභාවය වෙනස් වේ. රජගල පුරා විද්‍යා ක්ෂේත්‍රයෙන් සොයාගත් පබළු වල බහුතරය ඛනිජ පාෂාණ හා වීදුරු පබළු බව අනුමාන කළ හැකිය. පබළුවක වයනය කෙරෙහි අමුද්‍රව්‍යයෙහි බලපෑම ප්‍රබලය. ඔපදැමූ නිමි පබළුවක වයනයත්, ඔප නොදැමූ පබළුවක වයනයත් වෙනස්ය. ඇතැම් අමුද්‍රව්‍යය කාලයත් සමග ක්ෂය වී යාම හේතුවෙන් වයනය වෙනස් විය හැකිය. මෙහි දී හමු වූ පළිඟු පබළුවෙහි මතුපිට ස්වභාවය සුමටය.(රූපය- 08) එය හොඳින් ඔප දැමූ නිමි පබළුවකි. ටෙරා කොටා පබළු

වල මතුපිට රළුය. (රූපය- 06) වීදුරු පබළු වල වයනය සුමටය. ගල් පබළුද මීට සමාන මතුපිට ස්වභාවයක් දරයි. නමුත් පළිඟු පබළු වලට සාපේක්ෂව ඉහත දෙකෙහිම මතුපිට ස්වභාවය සුමට බවින් අඩුය. විශේෂ පබළු ලෙස දක්වෙන කානීලියන් සහ අගස්ති වලින් නිර්මිත බවට හඳුනාගත හැකි පබළු වල මතුපිට පබළු නිෂ්පාදන උපකරණයකින් හැඩ කළ සලකුණු දකගත හැකිය. (රූපය- 09)

**මෝස්තර මුලධර්ම**

ඵලදායි සන්නිවේදනයක් ඇති කිරීම සඳහා මෝස්තර මූලිකාංග එකිනෙක එක්ව යොදා ගැනීම සඳහා භාවිතා කරනු ලබන මෙහෙයුම් නිර්ණයකයන් මෝස්තර මුලධර්ම නම් වේ. මෝස්තර නිර්මාණාංගයක සාකච්ඡාවට බඳුන් කළ හැකි මෝස්තර මුලධර්ම දෙස විමසා බැලූ විට ඒවා එකිනෙක විස්තර කිරීම බෙහෙවින් අසීරු කාර්යයකි. මන්ද යත් මෝස්තර මුලධර්ම එකිනෙක බැඳී පවතින දම්වැලක් මෙනි. වෙන් වෙන්ව ගත් කල එහි අරුතක් සෙවීම අසීරු වේ. මෝස්තර මූලිකාංග යනු මෝස්තරය "කුමක්ද" යන්න නම් මෝස්කර මූලධර්ම යනු "කෙසේ ද" යන්න වේ.

**තුලනය(Balance)**

සමතුලිතතාවයෙහි මනෝවිද්‍යාත්මක සංවේදනය "තුලනය" ලෙස අර්ථ දැක්විය හැකිය. තුලනයෙහි කොටස් කිහිපයක් හඳුනාගත හැකි වේ. සමානුපාතික බෙදීමකට ලක්කළ හැකි නම් එය විධිමත් තුලනයයි. රජගල පුරා විද්‍යා ක්ෂේත්‍රය ආශ්‍රිත හමු වූ පබළු බොහොමයක් විධිමත් තුලනයක් යටතේ නිර්මාණය වූ ඒවා වේ. විශේෂයෙන් බෝධිසරය ආශ්‍රයෙන් සොයා ගන්නා ලද කහ පැහැති කොලර් පබළුවෙහි කිහිප දිශාවකින් එය සලකා බැලීමෙන් සනාථ කළ හැකිය. ටෙරාකොටා පබළු, වර්ණවත් වීදුරු පබළු ද සමානුපාතික තුලනයට අනුව නිර්මිත බව පෙනේ. (රූපය- 4,5,6,9) තවද තුලනයෙහි ආකාර තුනක් ලෙස සිරස් තුලනය, තිරස් තුලනය හා මධ්‍ය ලක්ෂයෙහි සිට සමානුපාතික විහිදීම මත තුලනය දැක්විය හැකිය. අරළු ගෙඩියක හැඩැති පබළුවෙහි එම ලක්‍ෂණය පෙන්වා දිය හැකිය. එහි මුදුනත සිට බැලූ විට මෙවන් විහිදීමක් සහිත තුලනයක් හඳුනා ගත හැකිය. (රූපය- 02.2)

පබළු එකිනෙක වෙන වෙනම සාදා ඒවා භාවිතයට ගැනීමේ දී එකිනෙක වෙන වෙනම සාදා ඒවා භාවිතයට ගැනීමේ දී එකිනෙක නූලක් හෝ එවැන්නක් තුළින් අමුණා ගැනීම සිදු කොට තිබේ. ඒ බව එකල දැක්වෙන මුරගල් කැටයම් සහ අනෙකුත් ටෙරා කොටා වැනි නිර්මාණ තුළින් හඳුනා ගත හැකි වේ. බොහෝ විට මේවා අමුණා ඇත්තේ මධ්‍යයේ සිට දෙපසට සමතුලිත තුලනයන් ඔස්සේ බව ඒවා නිරීක්‍ෂණයෙන් පෙනී යන කරුණකි. (රූපය- 24)

**සමානුපාතය (Proportion)**

එක් කොටසක් මගින් තවත් කොටසක විශාලත්වය, ප්‍රමාණය(මාත්‍රාව) හෝ පරිමාණය(මිණුම) පිලිබඳ සන්සන්දනාත්මක සබඳතාවයක් ඇතිවන ආකාරය මෙමගින් සාකච්ඡා වේ. රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් හමුවන විශේෂ පබළු 23 න් (රූපය- 01) හැඩයක් ගන්නා පබළුවෙහි මධ්‍යය කොටසට ඉහළින් සහ පහළින් ඇති කොටස් එකිනෙකට සාපේක්ෂව සමානතාවක් දක්වයි. මෙය මෙහි සමානුපාතයට උදාහරණ සපයයි.එසේම එහි අරළු ගෙඩියක ආකාරයෙන් දාර යෙදූ පබළුවෙහි දුර පිහිටා ඇත්තේ එකිනෙකට සාපේක්ෂව සමානුපාතිකවය.

**රටාව (Pattern)**

වස්තුවක් එහි කොටසක් හෝ සංකේතයක් කලා කෘතියක නැවත නැවතත් යෙදීම රටාව ලෙස ගිනිය හැක. රේඛා, හැඩතල, වර්ණ ආදී වූ දෘශ්‍යය මූලිකාංග තුලින් රටාවන් නිර්මාණය වේ. රජගලින් හමු වූ විශේෂ පබළු සමූහයේද එවන් රටා ගොඩ නැගී ඇති ආකාරය දකගත හැකිය.

**විවිධත්වය (Variety)**

දෘශ්‍යමය රූපයට සිත් ඇදගන්නා සුළු බවක් ඇතිවන්නේ විවිධත්වය තුළිනි. ඒ සඳහා වස්තූන්හි ප්‍රමාණය, පෙනෙන ආකාර, කෝණ ආදිය විවිධ වෙනස්කම් සිදු කරයි. නැවත නැවත යෙදෙන රටාවක් බිඳීමෙන් දෘශ්‍යමය රූපය ප්‍රාණවත් කරයි. (රූපය- 2.2, 10)

**රිද්මය (Rhythm)**

මෝස්තර මුලධර්ම අතර හඳුනාගත හැකි තවත් වැදගත් අංගයක් ලෙස රිද්මය හඳුන්වා දිය හැකිය. එය දෘශ්‍ය මූලිකාංග වූ රේඛා, වර්ණ, හැඩතල, වර්ණ ආදියෙහි දෘශ්‍ය සංකලනයක් ලෙස විවරණ්‍ය කළ හැකිය. රජගල ආශ්‍රිත පබළු එකතුව තුළින් රිද්මය යන්න

මනාව හඳුනා  හැකි වේ. පබළු තුළ කළ රේඛා විග්‍රහයේ දී හමු වූ බොහොමයක් රිද්මයානුකූල රටාවකට සුසැදි බව පෙනී යයි. පබළු එකිනෙක ඇමිණීම තුළින් ද එහි රිද්මයානුකූල බව තීව්‍ර කරගත් බව ද පෙනේ.

එකිනෙක පබළු අතර ඇති වෙනස් බව තුළින් ද රිද්මයක් ගොඩ නැගී ඇති බව කිව හැකිය. රිද්මය සහ චලනය එක් වූ කල සංගීතමය ස්පන්දනයක් ඇති කරවයි. පබළු එකිනෙක ඇමිණීම සහ එය පැළඳීමේ දී හෝ අවශ්‍ය කාර්යය සඳහා යොදා ගැනීමේ දී එකිනෙක සට්ඨනය තුළින් ඇතිවන ශබ්දය එවැන්නක් බව හෙළි කළ හැකිය.

### ඒකත්වය (Unity)

ඒකත්වය නැතිනම් එකතුව යන්න ද මූලධර්ම අතර හඳුනාගත හැකි තවත් එක් අංගයකි. සම්පූර්ණ නිර්මාණයෙහි සුසංයෝගය ඒකත්වය නම් වේ. එය සියලු ම දෘෂ්‍ය මූලිකාංගවල එකතුවකින් දෘශ්‍යමාන කරවයි. ඒකත්වය යන්න පබළු තුළින් හඳුනා ගත හැකිය. පෙරදී දෘශ්‍ය මූලිකාංග පිළිබඳ කළ විග්‍රහයේ දී එක් එක් මූලිකාංගය එක් කල විට ඒකත්වය යන්න පෙන්වා දිය හැකිය.

### සාකච්ඡාව සහ නිගමනය

රජගල පුරා විද්‍යා ක්ෂේත්‍රයේ ද්‍රව්‍යාත්මක ශේෂයන් ලෙස හමුවන පබළු වල නිර්මිත හැඩ පිළිබඳ විශ්ලේෂණයේදී ඒවා සාමාන්‍ය පරිසරයේ පවතින ඵල හා ජ්‍යාමිතික හැඩ ආදියට සමාන බවක් දක්වන බව තාර්කිකව නිගමනය කළ හැක. නෙල්ලි ගෙඩිය, අරළු ගෙඩියේ හැඩය, කොහොඹ ඵලය, මදටිය හෝ පුස් ඇට ආදිය උදාහරණ වේ. මේවා බොහෝ දුරට ආයුර්වේද බීජ සහ ඵල වන බව නිගමනය කළ හැකිය. නෙල්ලි ගෙඩිය, අරළු ගෙඩිය වැනි හැඩ සිතා මතා ගත්තාක් විය හැකි නමුත් සමහරක් හැඩ හෝ ආකෘති පබළු සිදුරු කිරීමේදී නිරායාසයෙන්ම පැමිණියා විය හැකිය. වයනය හැඩය හෝ ආකෘතිය පිළිබඳ කතා කිරීමේදී යම් පබළුවක් විවිධ කාලගුණික හෝ දේශගුණික බලපෑම් නිසාවෙන් හෝ දුර්වල අමුද්‍රව්‍යයක් වීම නිසාවෙන් කැඩී බිඳී ශේෂව පවතින කොටස්ද විය හැකිය. මෙහිලා එවැනි අවස්ථා විරලය.

සමකාලීන අනුරාධපුර යුගයේ පබළු වලට සමාන හැඩ වර්ණ රජගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ හමු වූ පබළු වලද දැකගත හැකිය. ඒවායෙහි දක්නට ඇති ආකාරයටම පබළු එකිනෙක අමුණා භාවිතයට ගන්නට ඇතැයි නිගමනය කළ හැකිය. මේවා නිර්මාණය සඳහා යොදා ගැනීමේදී ඒ සඳහා සුවිශේෂ තාක්ෂණික පියවර නිරූපණය කරන නිදර්ශන මෙතුළින් හඳුනාගත හැකිය.

### ඡායාරූප එකතුව



රූපය- 01




රූපය- 02



රූපය- 03




රූපය- 04




රූපය- 05




රූපය- 06



1 2 3 4




රූපය- 07




රූපය- 08




රූපය- 09



රූපය- 10



රූපය- 11



රූපය- 12



රූපය- 13



රූපය- 14



රූපය- 15

| | | |
|---|---|---|
|  රූපය- 16 |  රූපය- 17 |  රූපය- 18 |
|  රූපය- 19 |  රූපය- 20 |  රූපය- 21 |
|  රූපය- 22 |  රූපය- 23 |  රූපය- 24 |

## ආශ්‍රිත ග්‍රන්ථ


1. මල්කාන්ති නාලනී,2008, පබළු නිර්මාණ, ජේතවනාරාම පුරාවිද්‍යා ග්‍රන්ථ මාලා අංක 03 සංස්. සුදර්ශන් සෙනෙවිරත්න, පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යංශය.

2. වීරසේකර ගුණපාල , මහාවංශය,2011, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ,

3. Paranawithana S, 1970, Inscription of Ceylon Vol 01, Department of Archaeology, Ceylon, 56 p